**ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සංගමය - 2018**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1. මතය වියාචනය**

**------------------**

ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සංගමයේ ("සංගමය") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සිදුකිරීම සඳහා පොදු පරිචයේ යෙදෙන වරලත් ගණකාධිකාරීවරුන්ගේ සමාගමක් විසින් මට සහාය වන ලදී.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් සංගමයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි සපයා ගැනීමට මා හට නොහැකි විය.

**1.2. මතය වියාචනය සඳහා පදනම**

**---------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංගමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංගමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංගමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංගමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සංගමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාචනය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංගමය විසින් ද්විත්ව සටහන් ගිණුම් ක්‍රමයක් අනුගමනය කර නොතිබූ අතර, ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි. | සංගමයේ අදහස් ඉදිරිපත් කර නොමැත. | නිසි පරිදි ගිණුම් වාර්තා පවත්වා ගත යුතුය. |
| | ස්ථාවර වත්කම් ලේඛනයක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබූ අතර, දේපල, පිරියත හා උපකරණ විශ්වාසදායක ලෙස භෞතිකව සත්‍යාපනය කර ගැනීමට නොහැකි විය. | සංගමයේ අදහස් ඉදිරිපත් කර නොමැත. | නිසි පරිදි ගිණුම් වාර්තා පවත්වා ගත යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මැලේසියාවේ පැවති මයිලෝ පිහිනුම් ශූරතාවලිය සඳහා ක්‍රීඩකයන් 99 දෙනෙකුගෙන් හා නිලධාරීන් 5 දෙනෙකුගෙන් ලද එකතුව රු. 9,595,637 ක මුදලක් ගිණුම් පොතිවල සටහන් කර නොතිබුණි. | සංගමයේ අදහස් ඉදිරිපත් කර නොමැත. | නිසි පරිදි ගිණුම් වාර්තා පවත්වා ගත යුතුය. |
| (ආ) | රු. 2,908ක් ලෙස සුළු මුදල් ලේඛනයේ පෙන්නුම් කරන ශේෂය ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි. | සංගමයේ අදහස් ඉදිරිපත් කර නොමැත. | නිසි පරිදි ගිණුම් වාර්තා පවත්වා ගත යුතුය. |

## 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| අයිතමය | වටිනාකම රු. | සාක්ෂි නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| තරගාවලි ආදායම | 22,401,742 | ආදායම් වාර්තා | සංගමයේ අදහස් ඉදිරිපත් කර නොමැත. | ශේෂ සත්‍යාපනය කිරීම සඳහා විගණනය වෙත ප්‍රමාණවත් ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| ලියාපදිංචි ගාස්තු | 4,279,251 | ලදුපත් | සංගමයේ අදහස් ඉදිරිපත් කර නොමැත. | ශේෂ සත්‍යාපනය කිරීම සඳහා විගණනය වෙත ප්‍රමාණවත් ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| තොරතුරු තාක්ෂණ කළමනාකරුට ගෙවන ලද වැටුප් | 168,000 | ගෙවීම් වවුචර් | සංගමයේ අදහස් ඉදිරිපත් කර නොමැත. | ශේෂ සත්‍යාපනය කිරීම සඳහා විගණනය වෙත ප්‍රමාණවත් ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| පරිපාලන වියදම් | 465,000 | ගෙවීම් වවුචර් | සංගමයේ අදහස් ඉදිරිපත් කර නොමැත. | ශේෂ සත්‍යාපනය කිරීම සඳහා විගණනය වෙත ප්‍රමාණවත් ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| ක්‍රීඩකයන්ට අතිරික්ත ගෙවීම් | 108,717 | ක්‍රීඩකයන් වෙත මුදල් ආපසු ගෙවීම් සම්බන්ධ විස්තර | සංගමයේ අදහස් ඉදිරිපත් කර නොමැත. | ශේෂ සත්‍යාපනය කිරීම සඳහා විගණනය වෙත ප්‍රමාණවත් ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| මුළු ආදායම | 9,595,637 | ලදුපත් | සංගමයේ අදහස් ඉදිරිපත් කර නොමැත. | ශේෂ සත්‍යාපනය කිරීම සඳහා විගණනය වෙත ප්‍රමාණවත් ලේඛන ඉදිරිපත් කළ යුතුය. |

# 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.74,298 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 321,641 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 395,939 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මුළු ආදායම රු. 2,970,817 කින් අඩුවීම හා මුළු වියදම රු. 3,366,756 කින් අඩුවීම මෙම වර්ධනය සඳහා හේතු වී තිබුණි.